**කොවිඩ්- 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීම සඳහා අතිරේක මුල්‍යනය ව්‍යාපෘතිය (උප සංරචක 1.2) -2021**

**-----------------------------------------------------------------------------------------------------------**

කොවිඩ්- 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීම සඳහා අතිරේක මුල්‍යනය ව්‍යාපෘතියේ (උප සංරචක 1.2) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2020 ජුලි 23 දින එලඹි අංක 6727 - එල්කේ සහ 6728 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ V ව්‍යාස්ථාවේ 5.01 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට කාන්තා සහ ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යංශය, වර්තමානයේ සමෘද්ධි, ගෘහ ආර්ථිකය, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වසංගත කාලසීමාව තුළ පොරොත්තු ලේඛනයේ අයදුම්කරුවන් ඇතුළත් කිරීම සහ/හෝ පවතින මුදල් ලබාදීමේ වැඩසටහන් යටතේ වැඩි මුදලක් ලබා දීම මගින් ආබාධ සහිත වැඩිහිටි පුද්ගලයින් සහ නිදන්ගත රෝගාබාධ සහිත රෝගීන් සඳහා පවතින මුදල් ලබාදීමේ වැඩසටහන් හරහා මුදල් ලබාදීම් වැඩිකිරීම වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 16,248.45 කට සමාන එජඩො මිලියන 87.24ක මුදල ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යයනය කිරීමට එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2020 ජුලි 23 දින ආරම්භ කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 තත්ත්වාගනනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගනනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ
  බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ලැබී ඇති තොරතුරු අනුව, 2021 දෙසැම්බර් 31 දිනට උප සංරචක 1.2 සහ උප සංරචක 1.2 (ආ) සඳහා ණය නියෝජිතායතනය විසින් අයකරගන්නා ලද ඉදිරිපස ගාස්තුව රු. මිලියන 19.5ක් සහ පොළී ගාස්තු රු. 147.39ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | ඉදිරිපෙළ වියදම් සහ ප්‍රතිපූර්ණය සඳහා අවශ්‍ය ගිණුම් සකස් කරන ලදි. මෙම විගණන විමසුමේ සඳහන් කර ඇති කරුණ සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශයෙන් කිසිදු ප්‍රතිපූර්ණයක් සිදු කර නොමැත. | ණය නියෝජිතායතනය විසින් අයකර ගන්නා ලද ඉදිරිපස ගාස්තුව සහ පොලීය ව්‍යාපෘතියේ ලෙජර් ගිණුම්වලට ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 626 අනුව, එක් එක් ව්‍යාපෘතියේ මුල්‍ය ප්‍රකාශන ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වෙන වෙනම ගිණුම් වාර්තා මත පදනම්ව සකස් කළ යුතුය. කෙසේවෙතත්, ව්‍යාපෘතිය විසින් වෙනම ලෙජර් ගිණුම් කට්ටල පවත්වා ගෙන නොතිබුණි. | ඉදිරිපෙළ වියදම් සහ ප්‍රතිපූර්ණය සඳහා අවශ්‍ය ගිණුම් සකස් කරන ලදි. මෙම විගණන විමසුමේ සඳහන් කර ඇති කරුණු සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශයෙන් කිසිදු ප්‍රතිපූර්ණයක් සිදු කර නොමැත. | පිළිගත හැකි ගිණුම්කරණ මූලධර්ම හා උපචිත පදනමට අනුකූලව පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘතියේ ගිණුම් වාර්තා පදනම් කරගෙන වාර්ෂික ගිණුම් සකස් කළ යුතු අතර සියලුම පොත් සහ වාර්තා ද්විත්ව සටහන් පදනම මත පවත්වාගෙන යා යුතුය. |
| (ඇ) | මහා භාණ්ඩාගාරයේ වාර්තාවට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට ණය අංක 6727හි මුළු ණය ශේෂය එ.ජ.ඩො මිලියන 10.2ක් වූ අතර ණය අංක 6728හි වි.ගැ.හි මිලියන 13.19ක් විය. කෙසේවෙතත්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාවල අනුරූප ශේෂයන් පිළිවෙලින් එ.ජ.ඩො මිලියන 12.2ක් සහ වි.ගැ.හි මිලියන 14.18 ක් ලෙස දක්වා තිබුණි. එබැවින්, එ.ජ.ඩො මිලියන 2ක සහ වි.ගැ.හි මිලියන 0.99ක වෙනස්කම් විගණනයේදී නිරීක්ෂණය විය. | මුදල් ආපසු ගැනීම්වල සඳහන් මුදල සහ ප්‍රතිපූර්ණය කළ මුදල අතර වෙනස ව්‍යාපෘතියේ ගිණුම පවත්වාගෙන යන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් සත්‍යාපනය කළ යුතුය. | වෙනස සසඳා අදාළ ලෙජර ගිණුම්වලට නිසි ගැලපීම් සිදු කළ යුතුය. |

## 2.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| කොවිඩ් වසංගතයෙන් විපතට පත් ජනතාවට පහසුකම් සැලසීම සඳහා රජය විසින් වකුගඩු රෝගීන්, ආබාධිතයින් සහ අවුරුදු 70 සහ 100ට වැඩි අඩු ආදායම්ලාභී වැඩිහිටියන් සඳහා රු. මිලියන 2,326ක දීමනා ලබාදී තිබුණු අතර ජාත්‍යන්තර සංවර්ධන සංගමය සමඟ ඇති කර ගත් මූල්‍ය ගිවිසුමට අනුව ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 830.94ක් ප්‍රතිපූර්ණය කර තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් පවත්වාගෙන යනු ලබන පොත්වලට අනුව ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් ලබාදුන් ණය මුදලින් ලැබීම් සහ ප්‍රතිපූර්ණයන් වෙන් වෙන් වශයෙන් හඳුනාගත නොහැක. කෙසේවෙතත්, රජය ණය මුදලේ වෙන් කරන ලද මුදලට වඩා වැඩි මුදලක් විපතට පත් ජනතාවට ලබා දී ඇත | සමෘද්ධි, ගෘහ ආර්ථිකය, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ වගකීම වූයේ ප්‍රතිලාභීන් විසින් දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම් වෙත වියදම් අයදුම්පත් ඉදිරිපත් කිරීම පමණි. | ව්‍යාපෘතිය අනෙකුත් දීමනාවලින් ව්‍යාපෘති වියදම් වෙනම සටහන් කළ යුතු අතර ව්‍යාපෘති වියදම් වෙනම සටහන් කර මාසිකව ව්‍යාපෘති කාර්යාලය වෙත වාර්තා කරන ලෙස සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත දැනුම් දිය යුතුය. |

**2.3 නීති, රීති සහ රෙගුලාසි සමග අනුකූල නොවීම**

| අංකය | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ණය ගිවිසුමේ උපලේඛන 2හි (ඇ) වගන්තිය | අමාත්‍යාංශය තුළ ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය ස්ථාපනය කර පවත්වාගෙන ගොස් නොතිබුණි. | සමෘද්ධි, ගෘහ ආර්ථිකය, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ වගකීම වූයේ ලෝක බැංකුව විසින් මෙහෙයවනු ලබන "සේවාදායක සම්බන්ධතාව" ක්‍රමය හරහා හිමිකම් ඇති ප්‍රතිලාභීන් විසින් දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම් වෙත වියදම් අයදුම්පත් ඉදිරිපත් කිරීම පමණි. එබැවින් සමෘද්ධි, ගෘහ ආර්ථිකය, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ව්‍යාපෘති ඒකකයක් ස්ථාපිත කර නොමැත. | ව්‍යාපෘතිය විසින් අමාත්‍යාංශය තුළ ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය පිහිටුවා පවත්වාගෙන යා යුතුය. |
| (ආ) | ව්‍යාපෘති පත්‍රිකා අංක පීඒඩී 4021 | | | |
| | i. 45 වගන්තිය | ව්‍යාපෘති පත්‍රිකාවට අනුව, ව්‍යාපෘතිය යටතේ මූල්‍ය කළමනාකරණ කටයුතු කළමනාකරණය කිරීම සඳහා ප්‍රමාණවත් සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ව්‍යාපෘතිය විසින් අනුයුක්ත කර නොතිබුණි. | සමෘද්ධි, ගෘහ ආර්ථිකය, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ වගකීම වූයේ ලෝක බැංකුව විසින් මෙහෙයවනු ලබන "සේවාදායක සම්බන්ධතාව" ක්‍රමය හරහා හිමිකම් ඇති ප්‍රතිලාභීන් විසින් දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම් වෙත වියදම් අයදුම්පත් ඉදිරිපත් කිරීම පමණි. | ව්‍යාපෘතිය යටතේ මූල්‍ය කළමනාකරණ කටයුතු කළමනාකරණය සඳහා ප්‍රමාණවත් සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ව්‍යාපෘතිය විසින් අනුයුක්ත කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| ii. | 51 වගන්තිය | ව්‍යාපෘතිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් සියලුම කාණ්ඩවලට ගෙවන ලද ගෙවීම් ආවරණය වන පරිදි මාසික වියදම් වාර්තා එකතු කර වාර්තා කර නොතිබුණි. | සමෘද්ධි, ගෘහ ආර්ථිකය, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ වගකීම වූයේ ලෝක බැංකුව විසින් මෙහෙයවනු ලබන "සේවාදායක සම්බන්ධතාව" ක්‍රමය හරහා හිමිකම් ඇති ප්‍රතිලාභීන් විසින් දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම් වෙත වියදම් අයදුම්පත් ඉදිරිපත් කිරීම පමණි. | ව්‍යාපෘතිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් සියලුම කාණ්ඩවලට ගෙවන ලද ගෙවීම් ආවරණය වන පරිදි මාසික වියදම් වාර්තා එකතු කර වාර්තා කළ යුතුය. |
| iii. | 5.6.6 වගන්තිය | චක්‍රලේඛයට අනුව සියලුම හිමිකම් සහතික කළ වියදම් ප්‍රකාශ මගින් යුක්ත වේ. කෙසේවෙතත්, ඒ සම්බන්ධයෙන් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සුදුසුකම්ලත් ප්‍රතිලාභීන් වෙත ගෙවන ලද ගෙවීම් මත පදනම්ව මාසික වියදම් විස්තර සකස් කරන ලද අතර ඒවා ප්‍රතිපූර්ණය සඳහා ආපසු ගැනීමේ අයදුම්පත් සමඟ ඉදිරිපත් කරන ලදි. | සියලුම හිමිකම් සහතික කළ වියදම් ප්‍රකාශවලින් සමන්විය යුතුය. |
| iv. | 5.6.11 වගන්තිය | චක්‍රලේඛයට අනුව ප්‍රතිපූර්ණ ඉල්ලීම් සහ ලැබීම් සැසඳීම කළ යුතු අතර කිසියම් වෙනසක් පවතින විට ප්‍රදාන නියෝජිතායතනය සමඟ සම්බන්ධ වී යුතු අතර, ව්‍යාපෘතිය එවැනි සැසඳීමක් කර නොතිබුණි. | මුදල් ආපසු ගැනීම්වල සඳහන් මුදල සහ ප්‍රතිපූර්ණය කළ මුදල අතර වෙනස ව්‍යාපෘතියේ ගිණුම පවත්වාගෙන යන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් සත්‍යාපනය කළ යුතුය. | ප්‍රතිපූර්ණය ඉල්ලීම් සහ ලැබීම් සැසඳිය යුතු අතර කිසියම් වෙනසක් පවතින විට ප්‍රදාන නියෝජිතායතනය සම්බන්ධ කර ගත යුතුය. |
| (ඇ) | 2020 පෙබරවාරි අංක ඒජීඑස්/එස්එෆ්එස්/2021/65 දරණ විගණකාධිපතිගේ චක්‍රලේඛය | 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2022 පෙබරවාරි 28 හෝ ඊට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද 2022 ඔක්තෝබර් 16 දින ඉදිරිපත් කර තිබුණි. | පිළිතුර පිළිගත නොහැක. | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | මුදල් රෙගුලාසි 133 සහ ව්‍යාපෘති පරිපාලන ලේඛනයේ 53 වගන්තිය | ව්‍යාපෘතිය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | ව්‍යාපෘතිය සඳහා අභ්‍යන්තර විගණනය සිදු කර නොමැත. | ව්‍යාපෘතියේ ගනුදෙනු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය කළ යුතුය. |

### 3. මූල්‍ය කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ මූල්‍ය ප්‍රගතිය

කොවිඩ් වසංගතයෙන් බලපෑමට ලක් වූ ජනතාවට පහසුකම් සැලසීම සඳහා වකුගඩු රෝගීන්, ආබාධිතයින් සහ අවුරුදු 70 සහ 100ට වැඩි අඩු ආදායම්ලාභී වැඩිහිටියන් සඳහා රජය දීමනා ලබා දී තිබුණි. පසුව, ඉහත දීමනා මූල්‍යනය කිරීම සඳහා රජය ජාත්‍යන්තර සංවර්ධන සංගමය සමඟ ණය ගිවිසුමකට එළඹ තිබුණි. ණය නියෝජිතායතනය විසින් දෙන ලද රු. මිලියන 16,248.45 කට සමාන එ.ජ.ඩො මිලියන 87.24ක මුළු ප්‍රතිපාදනයෙන්, 2021 දෙසැම්බර් 31 දිනට සියයට 40.5ක් නියෝජනය කරන රු. මිලියන 6,433.32 කට සමාන එ.ජ.ඩො මිලියන 35.49ක මුදලක් පමණක් මේ සඳහා උපයෝජනය කර තිබුණි.